**කොහුවල හා ගැටඹේ ගුවන් පාලම් නිර්මාණය කිරීමේ හා ඉදිකිරීමේ ව්‍යාපෘතිය - 2022**

---

කොහුවල හා ගැටඹේ ගුවන් පාලම් නිර්මාණය කිරීමේ හා ඉදිකිරීමේ ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට මහාමාර්ග අමාත්‍යාංශය, වර්තමානයේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කොළඹ දිස්ත්‍රික්කයේ කොහුවල සහ මහනුවර දිස්ත්‍රික්කයේ ගැටඹේ ස්ථානගත කිරීමට සැලසුම් කර ඇති ගුවන් පාලම් සැලසුම් කිරීම සහ ඉදිකිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. කොහුවල ගුවන් පාලම සහ ගැටඹේ ගුවන් පාලම යන ස්ථාන 02 ක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය වටිනාකම රු. මිලියන 11,167 කට සමාන යූරෝ මිලියන 54.974 ක් වන අතර ඉන් රු. මිලියන 10,192 කට සමාන යූරෝ මිලියන 52 ක් සැපයීමට හංගේරියානු ආනයන - අපනයන බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි වටිනාකම වූ රු. මිලියන 975 ක් ශ්‍රී ලංකා රජය විසින් සැපයීමට නියමිතය. ව්‍යාපෘතිය එහි කටයුතු 2021 අගෝස්තු 16 දින ආරම්භ කරන ලද අතර, 2024 පෙබරවාරි 15 දින වන විට අවසන් කිරීමට නියමිතය.

**1.3 තත්වාගණනය කළ මතය**

මගේ මතය අනුව, මගේ වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලට වන බලපෑම් හැර 2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහයන් ගෙන් සමන්විත මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ අයුරින් පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණනය ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැලසීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අදහස් දැක්වීම.

**2.1** ගිණුම්කරණ අඩුපාඩු.

| අංකය | ගිණුම්කරණ අඩුපාඩුව/ විගණන නිරීක්ෂණය | වටිනාකම (රු.මිලියන) | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය **5** හි **43 (අ)** වගන්තියට අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුලත් එක් එක් වත්කම් සහ වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට පැවති විදේශ විනිමය අනුපාතයට ගැලපිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාල රු. මිලියන **2,044** ක් වූ ව්‍යාපෘතියේ විදේශ විනිමය අනුපාත වෙනස්කම් ගැලපීම ඉහත අවශ්‍යතාවය අනුව ගිණුම්ගත කර නොතිබුණි. | **2,044** | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු වාර්තාව සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තු ප්‍රකාශන අනුව රු. මිලියන **172.65** ක විදේශ විනිමය අනුපාත වෙනස සටහන් කර තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල වියයුතුය. |
| (ආ) | මෙම ව්‍යාපෘතිය ඇතුළුව විවිධ විදේශාධාර ව්‍යාපෘති හතක් ගොඩනැගිල්ල තුල ක්‍රියාත්මක වේ. කෙසේ වෙතත්, ව්‍යාපෘති අතර සාමාන්‍ය පොදු කාර්ය වියදම් බෙදා හැරීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ මුළු ගොඩනැගිලි කුලිය වූ රු. මිලියන **12.24** න් රු. මිලියන **4** ක් ව්‍යාපෘතිය විසින් ගෙවා තිබුණි. | **4** | විවිධ විදේශ ආධාර ව්‍යාපෘතිය යටතේ ව්‍යාපෘති **07** ක් ක්‍රියාත්මක වේ. එබැවින්, එක් එක් ව්‍යාපෘතිය වෙනුවෙන් එක් එක් මාසය සඳහා අක්මුදල් සහ ප්‍රතිපාදන ලැබීම මත අයකිරීම සිදුකරණු ලැබේ. | නිවැරදි වියදම මූල්‍ය ප්‍රකාශනවල පෙන්විය යුතුය. |

3. භෞතික කාර්ය සාධනය

3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| සංරචකය | ක්‍රියාකාරකම | 2022 දෙසැම්බර් 31 දිනට | | ප්‍රමාදය | ප්‍රමාදයන් සඳහා හේතු |
|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත භෞතික කාර්යසාධනය ප්‍රතිශතය | ලඟාකරගත් කාර්යසාධනය ප්‍රතිශතය | | |
| ගැටඹේ ගුවන් පාලම | ඉදිකිරීම් | 78 | 36 | ප්‍රමාදවීම | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය ප්‍රමාද වීම සහ කොන්ත්‍රාත්කරුට ගෙවීම් සිදුනොකිරීම ඉදිකිරීම්වල දුර්වල ප්‍රගතියක් පැවතීමට බලපා තිබුණි. |

| | |
|---|---|
| කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | අන්තර් ගෙවීම් සහතිකපත්‍ර (IPCC) සඳහා මුදල් නොගෙවීම හේතුවෙන් ව්‍යාපෘතිය සැලසුම් කළ පරිදි නිම කිරීමට නොහැකි විය. |
| විගණකගේ නිර්දේශ | ව්‍යාපෘති කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |

3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (i) | 2018 වසරේ රේඛීය අමාත්‍යාංශය විසින් සිදු කරන ලද මූලික ඇගයීමකට අනුව කොහුවල සහ ගැටඹේ ගුවන් පාලම් ඉදිකිරීමෙන් දිනකට රු. මිලියන 4.26 ක මුදලක් ජාතික ආර්ථිකයට ඉතිරි කර ගතහැකි බව හඳුනාගෙන තිබුණද, ඉදිකිරීම් කටයුතු ප්‍රමාදවීම හේතුවෙන් ව්‍යාපෘතියේ ප්‍රතිඵල ලඟාකරගැනීම ප්‍රමාද වී තිබුණි. | අන්තර් ගෙවීම් සහතිකපත්‍ර (IPCC) සඳහා ගෙවීම් නොකිරීම හේතුවෙන් සැලසුම් කළ පරිදි ව්‍යාපෘතිය නිම කිරීමට නොහැකි වී තිබුණි. | ව්‍යාපෘති ප්‍රතිඵල ලඟාකර ගැනීම සඳහා ව්‍යාපෘති ක්‍රියාකාරකම් කඩිනම් කළ යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 1,629 ක අන්තර් ගෙවීම් සහතිකපත්‍ර(IPCs) 07 ක් විදේශ ණය නියෝජිතායතනයට ඉදිරිපත් කර තිබුණද ඒ සඳහා කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම්කර නොතිබුණිත ඒ අනුව, සමාලෝචිත වර්ෂය අවසන් වන විට කොන්ත්‍රාත් ගිවිසුමේ සාමාන්‍ය කොන්දේසි අනුව ප්‍රමාද ගාස්තු ගෙවීමේ අවදානමක් පැවතුණි. | ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය ප්‍රතිව්‍යුහගත කිරීම හේතුවෙන් හංගේරියානු එක්සිම් බැංකුව අරමුදල් නිදහස් කිරීම නතර කර ඇත. 2022 අප්‍රේල් සිට පැවති සියලුම ගෙවීම් සඳහා තවමත් ගෙවීම්කර නොමැත. | අමතර පිරිවැය දැරීමකින් තොරව ණය නිදහස් කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.3 පද්ධති හා පාලන

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (i) | පාමංකඩ සිට කොහුවල දක්වා මාර්ගය ඉදිකිරීම සඳහා 2012 වසරේදී ජාතික මහාමාර්ග අංශ ව්‍යාපෘතිය (NHSP) මගින් ඉඩම් කැබලි 88 ක් පවරාගෙන තිබුණු අතර අදාළ ඉඩම් මෙම ව්‍යාපෘතිය යටතේ කොහුවල ගුවන් පාලම ඉදිකිරීම සඳහා අවශ්‍ය විය. කෙසේ වෙතත් 2021 දී මෙම ව්‍යාපෘතිය ආරම්භ වන තුරුම අත්පත් කරගත් ඉඩම් සඳහා වන්දි ගෙවා නොතිබීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර කාලය සඳහා ඉඩම් හිමියන් 50 දෙනෙකු වෙත රු. මිලියන 145.47 ක් වන්දි හා පොලී ලෙස ගෙවා තිබුණි. තවද, එවැනි ගෙවීමක් සිදුකිරීම සඳහා රේඛීය අමාත්‍යාංශයෙන් ලබාගත් අනුමැතිය විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණු බැවින් එය විගණනයේදී ගැටළුකාරී විය. | කොහුවල ගුවන් පාලම ඉදිකිරීමේ ව්‍යාපෘති ප්‍රදේශය විවිධ විදේශාධාර ව්‍යාපෘතිය වෙත පවරාගෙන කොහුවල ගුවන් පාලමේ ඉදිකිරීම් කටයුතු කරගෙන යන ලදී. ඒ අනුව, ඉඩම් හිමියන් සඳහා රු. මිලියන 145.47 ක පමණ වන්දි මුදලක් ගෙවීමට සිදු විය. | වෙනත් ව්‍යාපෘති සඳහා වන්දි සහ පොලී ගෙවීමට අනුමැතිය ලබාගත යුතුය. |
| (ii) | මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් අත්පත්කරගත් ඉඩම් සඳහා වන්දි හා පොලී ලෙවීමට වෙනත් ව්‍යාපෘති දෙකකින් ලබාගත් රු. මිලියන 14.65 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසන් වන විට පැවතුණි. එසේ වුවද, අදාළ මුදල් මාරුකිරීම සඳහා රේඛීය අමාත්‍යාංශයෙන් සහ භාන්ඩාගාරයෙන් ලබාගත් අනුමැතීන් විගණනය සඳහා ඉදිරිපත් නොවුණි. තවද, සමාලෝචිත වර්ෂය අවසන්වන විටත් අදාල මුදල් පියවීමට කටයුතුකර නොතිබුණි. | අලුතින් ආරම්භ කල ව්‍යාපෘතියේ ආරම්භක අදියරේදී බැංකු ගිණුම විවෘත කර නොතිබුණු අතර මූලික වියදම් ඒ වන විට ක්‍රියාත්මක වෙමින් පැවති ව්‍යාපෘති වලින් දරන ලදී. ඒ අනුව රජයේ අරමුදල් සංරචකය යටතේ ප්‍රමාණවත් මුදලක් ලැබුණු පසු ගෙවිය යුතු මුදල් පියවනු ලැබේ. | ගෙවිය යුතු මුදල් පියවීමට කඩිනම් පියවර ගත යුතුය. |